# මාධ්‍ය ආචාරධර්ම පිළිබඳව ග්‍රාහකයාගේ දැනුවත් බව

*එච්. සුදේශ් හසංග මෙන්ඩිස් අබේනායක්[1]*

ග්‍රාහකයා මාධ්‍ය භාවිතයේ දී මාධ්‍ය සාක්ෂරතාවෙන් යුක්ත ව මාධ්‍ය පරිහරණය කළ යුතු වේ. එමෙන් ම ග්‍රාහකයා මාධ්‍ය සංදේශ ඇසුරු කිරීමේ දී මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ විමසිලිමත් වීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආචාර ධර්ම යන්න පුවත්පත් මාධ්‍ය තුළ විධිමත් අයුරින් දැක ගත හැකි වුව ද අනෙකුත් මාධ්‍යන්හි අඩු වැඩි වසයෙන් දක්නට ලැබේ. වර්තමානයේ දී මාධ්‍ය තුළ මාධ්‍ය ආචාරධර්ම කඩ වන අවස්ථා බොහො ඇත. මාධ්‍ය ආචාර ධර්ම කඩ වූ විට එවා විභාග කිරීමට යාන්ත්‍රණ ද නිසි පරිදි සකස් ව නොමැති බව පෙර අධ්‍යනයන් පෙන්වා දී ඇත. මේ තත්ත්වය මත ග්‍රාහකයා තමා භාවිත කරන මාධ්‍ය හා බැඳි ආචාරධර්ම මොනවා ද දැන සිටීම වඩාත් වැදගත් වේ. ග්‍රාහකයා මාධ්‍ය සන්දේශ පරිහරණයේ දී මාධ්‍ය ආචාරධර්ම ගැන දැනුවත් ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. ග්‍රාහකයාගේ මාධ්‍ය සන්දේශ භාවිතයේ දී මාධ්‍ය ආචාර ධර්ම ගැන දැනුවත්භාවය පිළිබඳ සොයා බැලීම මෙහි ප්‍රධාන අධ්‍යයන අරමුණ වේ. මෙම පර්යේෂණය මිශ්‍ර ක්‍රමය යටතේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණයක් වේ. දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රාථමික දත්ත භාවිත කළ අතර සමීක්ෂණ ක්‍රමය යටතේ මාර්ගගත ප්‍රශ්නාවලියක් යොදා ගන්නා ලදී. ප්‍රශ්නාවලියෙ දී දත්ත එක්රැස් කිරීම උදෙසා නියැදිය වසයෙන් බස්නාහිර පළාතේ අවුරුදු 18ත් 35ත් අතර තරුණ තරුණියන් 100 දෙනෙකුගේ දත්ත පර්යේෂණය සඳහා භාවිත කරන ලදී. පර්යේෂණය තුළ විශ්ලේෂී ක්‍රමය හා තුලනාත්මක ක්‍රමය ඔස්සේ දත්ත විශ්ලේෂණය ඉදිරිපත් කරනු ලබයි. පර්යේෂණ අධ්‍යයනයේ දී නිගමන වසයෙන් ග්‍රාහකයා මාධ්‍ය සන්දේශ ලබා ගැනීමේ දී ආචාර ධර්ම නො සලකා හරින බවත්, මාධ්‍ය සාක්ෂරතාවය විධිමත් ලෙස අධ්‍යයනය කළ ග්‍රාහකයන් පවා මාධ්‍ය සංදේශ පරිහරණයේ දී මාධ්‍ය ආචාර ධර්ම ගැන නො සලකා මාධ්‍ය භාවිත කරන බව පෙන්වා දිය හැකි ය. එමෙන් ම බහුතරක් ග්‍රාහකයන්ට මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් ද ලැබී නොමැති බව පර්යේෂණය පෙන්වා දෙයි. ඒ සඳහා මාධ්‍ය සාක්ෂරතාව ඉගනුම සඳහා ප්‍රවේශ පුළුල් කිරීමට පර්යේෂණය විසින් යෝජනා කෙරේ.

***ප්‍රමුඛ පදඃ*** මාධ්‍ය ආචාර ධර්ම, ග්‍රාහකයා, මාධ්‍ය, සංදේශ

[1] ජනසන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. sudeshhasanga7@gmail.com